# එක්සත් ජාතික පසෂය බඳ පුපුරපු මහා මාර ගහක් වගේ

ජේ.ආර්. ජනාධිපති බලය පිහිටෙව්වේ සමාජවාදයට යන්න නෙවෙයි. ඒ බලය උවමනා කළේ පාර්ලිමේන්තු විමසුමක් නැතිව බහුජාතික සමාගම් එක්කල ගිවිසුම් ගහන්න ලේසි වෙන්න.

තනි බලයක් තියෙන කොට ඕනෑම ගිවිසුමක් ලේසියෙන් ගහන්න පුළුවන්. ඒ උඩ ණයකරයකට, බදුකරයකට, විකුණුම්කරයකට ගිවිසුමක් ගහන්න මහ කොම්පැණි විතරක් නෙවෙයි ලෝක බැංකුව වුණත් කැමැතියි.

අනෙක ජනාධිපති ක්‍රමය තුළ ඉන්න ජනාධිපතිට නැවත පත්වෙන්නත් ලේසියි. ඒ උඩ අවුරුදු 12 ක් ජනාධිපති බලය තියෙන කොට ගහන ගිවිසුමක් ඉක්මණට අවලංගු කරන්න බලපෑම් එයි කියල හිතන්න බෑ.

අනෙක් අතට බලපෑම් කරමින් වැඩවර්ජන කලකෝලහල ඇති කළත් තනි ඒකාධිපති බලයකට ඒවට මුහුණ දෙන්න ලේසියෙන් පුළුවන්. සියලු පොලිස් හමුදා මෙහෙයවල කැරලි මැඩපවත්වන්නත් ඉඩ ලැබෙනවා.

මේ අනුව ඒකාධිපති ජනාධිපති බලය ඇති කළේ ඉතාම පැහැදිලි සමාජ උවමනාවක් උඩ. එහෙම නැතිව ජේ.ආර්. ට ඒකාධිපති පිස්සුවක් තිබුණ නිසා නෙවෙයි.

ධනපතියන්ම පාර්ලිමේන්තුවාදය ඇති කළාට උවමනා වෙලාවට ඒකාධිපති ක්‍රමය යොදන්නත් ලෑස්තියි. මේ කරුණු අපි මුළු මිනිස් ඉතිහාසය පුරාම දකල තියෙනවා.

ඇත්ත තමයි, සමාජවාදයට බලය ගත් උදවියත් සමහර වෙලාවට ඒකාධිපති බලයට යොමු වුණා.

ජාතිවාදීන්ගේ කෝලාහලවලට මුහුණ දෙන්නට, නැත්නම් අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණවලට මුහුණ දෙන්නට ටික කලකට බලය තනි අතකට ගැනීමත් සිදු වෙන්න පුළුවන්.

සමහර ආණ්ඩුවේ ඇමැතිවරු පෙන්නන්න හදන්නේ මේ මහින්ද රාජපක්ෂත් සමාජවාදයට යන්න මේ බලතල ඉල්ලනව කියල. ඒ අනුව ඒ ඇත්තෝ අහනව කැස්ත්‍රෝ දිගටම බලයේ හිටිය නම් ඇයි මහින්ද හිටියම වරද මොකක්ද කියල.

ඇත්තටම සමාජවාදයට යන්න ඒකාධිපති බලයක් අවශ්‍ය නෑ. ඒත් මහින්ද මේ බලය ගන්නේ සමාජවාදයට තබා සමානාත්මතාවයටවත් නෙවෙයි. ජේ.ආර්. ටත් වඩා හොඳින් බහුජාතික සමාගම්වලට ඉඩකඩ හදල දෙන්නයි මේ පාලකයා හදන්නේ.

දනටමත් බෙල්ල හිර වෙන්නම ලෝක බැංකුවට, මූල්‍ය අරමුදලට මෙන්ම විවිධ ධනපති රටවල්වලට ණය වෙලයි මුන්නැහේ ඉන්නේ. මෑතදී ආපු මූල්‍ය අරමුදලේ කොමසාරිස් කණ්ඩායම කිව්වේ බදු වැඩි කරල, ඉල්ලීම් පාගල, සහනාධාර කපල මේ ආණ්ඩුව නිසි මාර්ගයේ යනව කියල.

විශේෂයෙන් විදේශ ආයෝජන පහසුකම් හා ඉඩකඩ වැඩි කර දීම ගැනත් අය විශේෂ ස්තුතියක් පළ කළා. ඒ අතරම උපදෙස් දුන්නා බදු පරාසය වැඩි කරමින්, සහන ඉතාම දිළිඳු අයට පමණක් සීමා කරල, අයවැය පරතරය තව අඩු කරන්න ක්‍රියා කරන්න කියල.

මේ අනුව පෙනෙනවා මේ ලෝක බලවතුන් මොන විදියේ ගමනක්ද අපට යන්න කියන්නේ කියල. ලොකු එකාට ඉඩ දීමට පොඩි එකා පාගාගෙන පලයන් කියන කථාවයි ඒ අය කියන්නේ.

මේවට යට වෙමින් මුදල් අරන් අපව වහල් ණයකාරයෝ කරන එකයි මේ වෙන්නේ. ඇමරිකාව, ඉන්දියාව වගේම ඊශ්‍රායල්කාරයෝ එක්කත් මහින්ද ගිවිසුම් ගහල තියෙන්නේ. ආරක්ෂක ගිවිසුම් පවා ඇති කරගෙන තියෙනවා.

එතකොට යැංකි අධිරාජ්‍යවාදයේ ඉහළ කෙළවරටම බැඳිල වැඩ කරන තැනට මහින්ද පත් වෙලා තියෙනවා. මේ වගේ ප්‍රතිගාමී වැඩපිළිවෙලකටයි, මේ රට වහල් කිරීමටයි මේ බලය තහවුරු කරගන්නට කටයුතු කරන්නේ.

අනෙක් අතට මේ වහල් ගිවිසුම් නිසා දුප්පත්කමට, මර්දනයට යට වෙන ජනතාව වැඩවර්ජන හා ජනතා කැරලිවලට ගියොත් බිහිසුණු මර්දනවලට යන්න බලාගෙනයි මේ බලය තහවුරු කරන්නේ.

ඇත්තටම යූ.ඇන්.පී. ය බෙදිල තියෙන්නෙත් ඒ ඇත්තෝ ගෙනියන්න බලාපොරොත්තු වන වැඩ කොටස දැන් ඉතා හොඳින් කෙළින්ම මහින්ද ඉදිරියට ගෙන යන නිසයි.

රනිල් මහත්තයා මහින්ද නිතර හමුවෙලා නිතර කථාබහ කරන්නේ දෙන්නගේ ගමන එක දිසාවටම නිසයි. ඉස්සර මේ දෙන්න හැම වෙලේම ඇණකොටා ගත්තා.

එදා මහින්ද පෙනී සිටියේ සමාජවාදය නැත්නම් දේශීය ජනතාවාදී වැඩපිළිවෙලකටයි. ඒ අතර වැඩ කරන ජනතාවගේ හිතමිතුරෙක් හැටියටත් නිතරම පෙනී සිටිය.

අනෙක් අතට රනිල් පෙනී සිටියේ සමාජවාදයේ හතුරෙක් හැටියට. උන්නැහේ කල්පනා කළේ වෙළෙඳපොල ආර්ථිකය දියුණු කරල ධනපතියන් විශාල ලෙස ඇති වන ගමනක් යන්න.

මේ උඩ ජනතාව බෙදුනෙත් මේ ආර්ථික - දේශපාලන ගමන් දෙක අනුවයි. ඒ අනුව ශ්‍රී ල.නි.ප. වම හැටියට නැත්නම් සමාජවාදී පක්ෂයක් හැටියටත් සලකන තැනකට පත් වුණා.

යූ.ඇන්.පී. ය දකුණ හැටියට, නැත්නම් ධනපති පක්ෂයක් හැටියටත් නම් කළා. ඒ මදිවට යූ.ඇන්.පී. ය තනිකරම මූල්‍ය අරමුදලේ ඒජන්තයෙක් හැටියටත් හැඳින්වුණා.

දැන් මේ මාර්තෘකා වෙනස් වෙලා. දැන් ලොකුම බටහිර ගැති කණ්ඩායම මහින්දගේ බලවේගයයි. ඒ නිසා යූ.ඇන්.පී. යේ ලොකු කඩාවැටීමක් ඇති වීම පුදුමයක් නෙවෙයි.

ඒ වගේම යූ.ඇන්.පී. යේ අය මහින්ද ළඟට යන එක පුදුමයකුත් නෙවෙයි. මට නම් පුදුම මේ තරම් දකුණට ගිය බලවතෙක් එක්ක කොහොමද වමේ කියාගන්න මිනිස්සු එකතු වෙලා ඉන්නේ කියලා.

ඉස්සෙල්ලා කිව්වා කොටින්ට විරුද්ධ වුණාම 13 වැනි ව්‍යවස්ථා බලතල වැඩි කරන ලොකු ප්‍රජාතන්ත්‍රවාදයෙක් ගැන. ජනාධිපති ක්‍රමයත් ඉවත් කරාවි කිව්ව. මේ ඔක්කොම බොරු වෙලා තනිකරම දකුණේ වැඩපිළිවෙලක් ගෙනියන තැනට එයා පත් වෙලා ඉන්නේ.

ඒත් මේ අවස්ථාවාදී වම එයාගේ තුරුළට වෙලා ඉන්න එක නම් පුදුමයි. මේ අය එදා ජේ.ආර්. ට කරන්න බැරි වුණ රට පාවා දීමේ වැඩකොටස තමයි දැන් මහින්ද සමඟ එකතු වෙලා කරගෙන යන්නේ.

ඒ විතරක් නෙවෙයි, වම ගොඩනැගෙන එකටත් විරුද්ධව හැම දෙයක්ම කරනවා.

කොහොමටත් අලුත් වමේ නැමියාවක් ඇති වෙන්න පුළුවන් මේ අර්බුදය තුළින්ම. 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව ඇති වුණ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී එකමුතුව එවැනි දෙයකට මුල පිරීමක් වෙන්න පුළුවන්.

මේ ආණ්ඩුවේ ඒකාධිපති වියරුව සමාජ උවමනාවක් ලෙසට දක්ක උදවිය තමා මේ නැමියාව තුළ එකතු වුණේ. එය පුද්ගලික වියරුවක් හැටියට දකින අය හැදුවේ මේකට විරුද්ධව දේශපාලනයෙන් තොර පෙරමුණක් හදන්න.

ඒත් එයට වඩා ඇති වුණේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ගමනත්, ජාතිවාදී මැද පංතික සිංහල විරෝධයන් අතර තරඟයත්. ජනතා විමුක්ති පෙරමුණ ලොකුවට කැකෝ ගැහැව්වත් වැටුනේ සිංහල මැද පංතික විරෝධයට.

ඒ අනුව ඉක්මණින් විකල්පයක් ලෙසට ගොඩනැගෙන්න ඔවුන් උත්සාහ කරනවා. ජනරාල් ඉන්න නිසා දේශීය ධනපති කොටස් තමන්ට එකතු කරගන්න පුළුවන් කියලත් ඔවුන් හිතන බව පෙනෙනවා.

ජනරාල්ට එළියට ඇවිත් ධනපති විකල්පයක් ගොඩනගන්න ඉක්මණට ඉඩ ලැබෙයිද කියල පෙනෙන්න නම් නෑ.

අනෙක් අතට දැන් හිරගෙදර ඉඳගෙන හරි තමන්ගේ වැඩපිළිවෙල ඉදිරිපත් කළොත් තමයි විකල්ප මාවතක් කියල පිළිගැනීමක් ඇති වෙන්නේ.

එහෙම නැතිව සිංහල වීරයා හිරේ, KP නිදැල්ලේ කියල කෑගැහැව්වට විකල්පයක් ඇති වෙන්නේ නෑ.

අනෙක් අතට ඒ කෑගැහිල්ල ඇත්තටම ජාතිවාදී කෑගැහිල්ලක්. ඒකෙන් ලංකාව තුළ විකල්පය ජේ.වී.පී. එකට ගොඩනගන්න ලැබේවි කියල හිතන්න අමාරුයි.

මේ ආණ්ඩුවේ සංවර්ධන වැඩපිළිවෙලට විරුද්ධව තමන් කරන්න යන්නේ මොකක්ද කියල මතු කරන්නේ නැතිව නම් මැන්ඩෙලා කෙනෙක් වෙන්න අමාරුයි.

තමන්ගේ ප්‍රශ්න ජනතාවට කියනවට වඩා, ජනතාවගේ ප්‍රශ්නවලට තමන්ගේ විසඳුම් කිව්වොත් තමයි නායකයෙක් ලෙසට කැපී පෙනෙන්න පුළුවන්. ජනතාවට උවමනා තමන්ට තිබෙන ප්‍රශ්න ගැන කථා කරන, වද වෙන නායකයින්. ඒ උඩයි ජනරාල්ගේ ඉරණම තීන්දු වෙන්නේ.

කොහොම වුණත් ලංකා ඉතිහාසයේ අලුත් යුගයකට අපි ඇවිත්. මෙතෙක් තනියම ඉන්න ලොකුම පක්ෂය හැටියට කඳවුරු බැඳල තිබුණ එක්සත් ජාතික පක්ෂය බඳ පුපුරපු මහා මාර ගහක් වගේ ඇද වැටෙන්නට පටන් අරන්.

ඒ අතරින්ම අලුත් අභියෝගයකට පාර කැපෙන්න ඉඩ තියෙනවා.